# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2030/33 - 2017 අගෝස්තු මස 02 වැනි බදාදා - 2017.08.02**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2016 අංක 03 දරන මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, මිනිස් බල අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමූපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදහැරීම කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍යාංශයේ ලේකම් පී. බී. විජයරත්න වන මම මෙහි පළකරන ලද මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රඥප්ති කෙටුම්පත මෙම *ගැසට් පත්‍රයේ* පළ කරන දිනයේ සිට සති දෙකක් ඉකුත් වීමෙන් පසු මධ්‍යම පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ මා වෙත ඉදිරිපත් කළ හැක.

පී. බී විජයරත්න
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන හා අධ්‍යාපන සහ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන, හා පළාත් පරිපාලන, මිනිස් බල,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ඉඩම්, සමූපකාර සංවර්ධන,
වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙද හැරීම් කටයුතු පරිසර කටයුතු
සහ ආයෝජන සම්බන්ධීකරණ වෙනත් අමාත්‍යාංශයක් යටතට නොගැනෙන
විෂයයන් භාර අමාත්‍යාංශයේ ලේකම්

2017 ජූලි මස 25 වැනි දින,
පල්ලේකැලේ,
මධ්‍යම පළාත් සභාවේ
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## මධ්‍යම පළාත් සභාවේ 2016 අංක 3 දරන සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා වූ ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාත් සභාව සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද, ප්‍රදර්ශනය හා ප්‍රසිද්ධ රඟ දැක්වීම සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම හැර රැඟුම්හල් සහ රඟදැක්වීම හා පළාතේ සාහිත්‍ය කටයුතු, සංගීතය සහ විනෝද කටයුතු ඇතුළු කලා කටයුතු විධිමත් කිරීම, ජාතික වැදගත්කමකින් යුතු යැයි පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර පුරාවිද්‍යාත්මක භූමි, නටඹුන් පෞරාණික හා ඓතිහාසික ස්මාරක හා වාර්තා පිළිබඳ පර්යේෂණ හා විමර්ශන පැවැත්වීම, සංරක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාමට අවශ්‍ය විධිවිධාන සැලසීම සහ මධ්‍යම පළාත් සභාව විසින් පාලනය කරනු ලබන සහ අරමුදල් සපයන කෞතුකාගාර හා වෙනත් ඒ හා සමාන ආයතන පවත්වාගෙන යාම සහ විධිමත් කිරීම සහ අවශ්‍ය විධිවිධාන සැලසීම සඳහා සහ ඒ හා සම්බන්ධ හා ඊට අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් සභාවේ 2016 අංක 3 දරන සංස්කෘතික කටයුතු ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වේ.

### *I කොටස*

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව පිහිටුවීම.

මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවීම

1. මෙම ප්‍රඥප්තියේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා (මින් මතු දෙපාර්තමේන්තුව නමින් හඳුන්වනු ලබන) මධ්‍යම පළාතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතුය.

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වරයා පත්කිරීම

2. (1) දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පළාත් අධ්‍යක්ෂවරයෙකු පත් කළ යුතු වන්නේය.

(2) පළාත් අධ්‍යක්ෂවරයා ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු අතර ඔහු දෙපාර්තමේන්තු ප්‍රධානියා විය යුතුය.

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය

3. දෙපාර්තමේන්තුවේ කර්තව්‍යයන් හා බලතල ඉටු කිරීම සඳහා පළාත් සංස්කෘතික අධ්‍යක්ෂවරයාට සහය වීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් නිලධාරීන් හා කාර්ය මණ්ඩලය 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධානවලට අනුකූලව පත් කළ යුතු වන්නේය.

දෙපාර්තමේන්තුව සඳහා අනෙකුත් නිලධාරීන් පත්කිරීම

බලතල පවරා දීම

4. පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල හා කර්තව්‍යයන් ඉහත 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන නිලධාරීන් වෙත පවරා දිය හැකිය.

දෙපාර්තමේන්තුවේ පරමාර්ථ

5. පහත සඳහන් පරමාර්ථ ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ වගකීම වන්නේය.

(1) ප්‍රදර්ශනය හා ප්‍රසිද්ධ රඟ දැක්වීම සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම හැර පළාත තුළ රැඟුම් හල් හා රඟ දැක්වීම් සිනමාහල් ප්‍රසංග හා විනෝද කටයුතු සම්බන්ධයෙන් නියාමනය කිරීම හා විධිමත් කිරීම්.

(2) ජාතික වැදගත්කමකින් යුතු යැයි පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මඟින් හෝ නීතියක් යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර පෞරාණික හා ඓතිහාසික ස්මාරක හා වාර්තා සංරක්ෂණය හා පවත්වාගෙන යාම,

(3) පළාත් සභාව විසින් පාලනය කරන කෞතුකාගාර ඒ හා සමාන ආයතන පවත්වා ගෙන යාම හා සංරක්ෂණය කිරීම,

(4) පළාත තුළ සාහිත්‍ය, ආගමික හා වෙනත් සංස්ථාගත කරනු නොලැබූ සමිති, සංගම් විධිමත් කිරීම හා කලායතන සම්බන්ධ කටයුතු කිරීම,

(5) පළාත තුළ කලා හා සාහිත්‍ය අංශවල නිර්මාණ හැකියාවන් වැඩිදියුණු කිරීම හා කලාකරුවන්ගේ සුබ සාධනය,

(6) මධ්‍යම පළාතේ ස්පර්ශනීය හා අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීම සඳහා සංස්කෘතික හා කලා කටයුතු කලාකරුවන් හා ඊට අදළ අංශ පිළිබඳ පර්යේෂණ, විමර්ශන පැවැත්වීම ඒ පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීම හා සංරක්ෂණය කිරීම,

(7) මධ්‍යම පළාත තුළ ආගමික, සංස්කෘතික, සාහිත්‍ය, කලා සදචාරාත්මක හා අධ්‍යාත්මික යහගුණයන් ප්‍රවර්ධනය කිරීම.

6. දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා බලතල පහත පරිදි විය යුතු ය.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් හා බලතල

(1) පළාත තුළ සංස්කෘතික කණ්ඩායම් පිහිටුවීම හා ඒ සඳහා ශිල්පීන් බඳවා ගැනීම, ඔවුන්ට අදළව දීමනා ගෙවීම හා ශිල්පීන් සංදර්ශන සඳහා යොදවා ගැනීම,

(2) සංස්කෘතික කමිටු පිහිටුවීම, ලියාපදිංචි කිරීම, කළමනාකරණය කිරීම, අධීක්ෂණය, විගණනය හා විසුරුවා හැරීම.

(3) කලායතන ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම.

(4) පළාත් සභාව විසින් අරමුදල් සපයන කෞතුකාරගාර හා වෙනත් ඒ හා සමාන ආයතන පිහිටුවීම, පවත්වාගෙන යාම හා පාලනය.

(5) මධ්‍යම පළාත තුළ රැගුම්හල් හා සිනමාහල්වල සනීපාරක්ෂාව, මහජන යෝග්‍යතාවය, හා ඊට අදළ සියලු කරුණු පිළිබඳව ප්‍රමිති නියම කිරීම, පරීක්ෂා කිරීම,

(6) පළාත තුළ සංස්කෘතික වැඩ සටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයීම හා ආධාර දීම,

(7) සංස්කෘතික කමිටු හා කලායතන පිහිටුවීම හා ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට අවශ්‍ය කටයුතු කිරීම.

(8) මෙම දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන සහය රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන හෝ වෙනත් නෛතික පුද්ගලයන්ගෙන් ලබා ගැනීම සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම,

(9) කලාකරුවන්ගේ සුබ සාධනය සලසාලනු පිණිස වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම හා පහසුකම් සැලසීම,

(10) පළාත තුළ සංස්කෘතික ගම්මාන පිහිටුවීම හා පාරම්පරික දැනුම අනාගත පරපුර වෙත ආරක්ෂාකර දීම සඳහා අවශ්‍ය වැඩසටහන් සැලසුම්කිරීම,

(11) කලායතන, ප්‍රාදේශීය සංස්කෘතික කමිටු, පළාත් සංස්කෘතික බල මණ්ඩලය ඉදිරිපත් කරනු ලබන මූල්‍ය හා ගිණුම් වාර්තා විගණනයට භාජනය කිරීම, හා මූල්‍ය අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් අදළ නීතිමය කටයුතු කිරීම

(12) (අ) පළාතේ සුරක්ෂිත කළ යුතු සංස්කෘතික උරුමයන් ලෙස හඳුනාගත් පූජා භාණ්ඩ, ඇඳුම් ආයිත්තම්, කලා ශිල්ප ආශ්‍රිත භාණ්ඩ "පළාතේ සුරක්ෂිත කලයුතු සංස්කෘතික උරුමයන්" ලෙස නම් කිරීම

(ආ) "පළාතේ සුරක්ෂිත කළ යුතු සංස්කෘතික උරුමයන්" ලෙස නම් කළ පූජා භාණ්ඩ, ඇඳුම් ආයිත්තම්. කලා ශිල්ප ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය, විකිණීම හා බෙදා හැරීම පිළිබඳ හා ඊට අනුශංගික කරුණු පිළිබඳ ප්‍රමිතීන් නියම කිරීමට සහය වීම.

(13) (1) දෙපාර්තමේන්තුවේ කාර්යයන් වෙනුවෙන් රංග ශාලා, සිනමා ශාලා, විනෝද ප්‍රසංග පවත්වන ස්ථාන, කලා නිර්මාණ විකිණීම, ප්‍රදර්ශනය හා බෙදා හැරීම කරනු ලබන ස්ථානවලට

(අ) ඇතුළුවීම,

(ආ) පරීක්ෂා කිරීම,

(ඇ) යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, වාර්තාවක්, සහතිකයක් හෝ වෙනත් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටීම,

(ඈ) එකී බලපත්‍රය, අවසර පත්‍රය, වාර්තාව, සහතිකය හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම,

(ඉ) අවශ්‍ය ලේඛන සහ තොරතුරුවල පිටපත් ගැනීම හෝ උධෘත බැලීම,

(ඊ) ස්ථාන භාර නිලධාරීන්ගෙන් හෝ වෙනත් අවශ්‍ය පුද්ගලයින්ගෙන් විමසීම් කිරීම හා විමර්ශනය කිරීම.

දේශීය හා විදේශීය හා වෙනත් ආයතන

(14) මෙම දෙපාර්තමේන්තු කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සිතන රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන, දෙපාර්තමේන්තු කටයුතු ඉටු කර ගැනීම හා දේශීය හා විදේශීය වෙනත් නෛතික පුද්ගලයන්ගේ සහය ලබා ගැනීම සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධීකරණය පැවැත්වීම.

(15) දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටුකර ගැනීමේදී අවශ්‍ය අවස්ථාවලදී පොලිසියේ සහය ලබාගැනීම.

## *II කොටස*

*මධ්‍යම පළාත් සංස්කෘතික කණ්ඩායම් පිහිටුවීම*

සංස්කෘතික කණ්ඩායම් පිහිටුවීම

7. (1) පළාතේ සෞන්දර්ය කලාවන් ප්‍රවර්ධනය කර සුරක්ෂිත කිරීම සඳහාද, ඔවුන්ගේ ආර්ථික ශක්තිය වැඩි දියුණු කිරීම සඳහා ද පළාත් නර්තන, ගායන, වාදන ක්ෂේත්‍ර සඳහා සංස්කෘතික කණ්ඩායම් පිහිටුවනු ලැබිය හැක්කේය. මෙම කණ්ඩායම් පළාත් අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යා යුත්තේය.

(2) සංස්කෘතික කණ්ඩායම් සඳහා ශිල්පීන් හා උපදේශකවරුන් බඳවා ගැනීම, සුදුසුකම් තීරණය කිරීම, විනය පාලනය හා අධීක්ෂණය, ඔවුන්ට අදළ දීමනා ගෙවීම, ඉවත් කිරීම යන කරුණු පිළිබඳව පළාත් අධයක්ෂවරයාට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය යටතේ විධිවිධාන සැලැස්විය හැක්කේය.

(3) දෙපාර්තමේන්තුවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය යැයි හැඟෙන කටයුතු සඳහා සංස්කෘතික කණ්ඩායම් මෙහෙයවීමේ හැකියාව සංස්කෘතික අධ්‍යක්ෂවරයාට ඇත්තේය.

## *III කොටස*

ප්‍රාදේශීය සංස්කෘතික කමිටු හා පළාත් සංස්කෘතික බල මණ්ඩලය පිහිටුවීම

සංස්කෘතික කමිටු පිහිටුවීම

8. (1) සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම එක බැගින් මින් මතු කමිටු යනුවෙන් හැඳින්වෙන් ප්‍රාදේශීය සංස්කෘතික කමිටු පිහිටුවනු ලැබිය යුතුය.

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පදිංචි කලාකරුවන්, ගුරුවරුන් ආදී කලාවට සම්බන්ධ පුද්ගලයින්ට ප්‍රාදේශීය සංස්කෘතික කමිටුවේ සාමාජිකත්වය ලබාගත හැකි වන්නේය.

(ආ) කමිටුවේ සාමාජිකයන් අතරින් මහ සභා රැස්වීමකදී කමිටුව සඳහා සභාපතිවරයෙකු, ලේකම්වරයෙකු හා භාණ්ඩාගාර වරයෙකු තෝරා පත් කර ගත යුත්තේය.

(ඇ) අදල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා ප්‍රාදේශීය සංස්කෘතික කමිටුවේ නිල බලයෙන් අනුශාසක වන අතර, සංස්කෘතික නිලධාරීවරයා කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය කළ යුතුය.

(2) කමිටුවේ නිල කාලය වසරකි.

සංස්කෘතික කමිටු ව්‍යවස්ථාවට ඇතුලත් විය යුතු පොදු විධිවිධාන

9. (1) සෑම කමිටුවකම කමිටුවේ සංයුතිය, කමිටුවේ ගිණුම හා කමිටුව පවත්වා ගෙන යාමට අවශ්‍ය අනෙකුත් විධිවිධාන ඇතුලත් ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර පළාත් අධ්‍යක්ෂගේ නිර්දේශය මත කමිටු ව්‍යවස්ථාවක අඩංගු විය යුතු පොදු විධිවිධාන අමාත්‍යවරයා විසින් කලින් කලට රෙගුලාසි මඟින් නියම කරනු ලැබිය හැකි ය.

(2) කමිටුවේ අවශ්‍යතාවයන්ට අනුව ඉහත කී පොදු විධිවිධානයන්ට පටහැනි නොවන පරිදි සමිති ව්‍යවස්ථාවන් සකස් කර ගැනීමට කමිටුවලට හැකියාව ඇත.

10. ප්‍රාදේශීය සංස්කෘතික කමිටුවල බලතල පහත පරිදි විය යුතුය.

ප්‍රාදේශීය සංස්කෘතික කමිටුවල බලතල

(1) කොට්ඨාශය තුළ ස්පර්ශනීය හා අස්පර්ශනීය උරුමයන් සුරක්ෂිත කරන ආගමික, සංස්කෘතික, සදාචාරාත්මක හා අධ්‍යාත්මික යහගුණයන් ප්‍රවර්ධනය කිරීමට සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම,

(2) පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ කාර්යයන් ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමට සහය වීම,

(3) කමිටු බල ප්‍රදේශයේ ජීවත් වන කලාකරුවන් වෙනුවෙන් මධ්‍යම පළාත් සභා, හෝ මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් වරින් වර ඉදිරිපත් කරනු ලබන සුභසාධන අවස්ථාවන්හි හා වෙනත් විවිධ අවස්ථාවන්හි සමාන හා සමතාවයෙන් බෙදී යන වැඩ පිළිවෙලක් ස්තාපිත කිරීම සඳහා කටයුතු කිරීම,

(4) ග්‍රාමීයව සිදු කෙරෙන විවිධ කලා නිර්මාණයන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, ග්‍රාමීය කලාකරුවන්ගේ තත්ත්වයන් ප්‍රමිතිගත කිරීමට දයක වීම හා එම නිර්මාණ වලට තරගකාරීත්වයෙන් යුත් නිර්මාණ අගය කිරීමේ පසුබිමක් රාජ්‍ය මට්ටමින් ඇති කිරීමට කටයුතු කිරීම,

(5) සියලු අංශයන් නියෝජනය කරනු ලබන කලාකරුවන්ගේ අදහස්, යෝජනා සහ සහභාගීත්වය සඳහා වේදිකාවක් ස්ථාපිති කිරීම හා එම කලාකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(6) නව්‍යතාවයෙන් යුතු විවිධ සංස්කෘතික හා කලා වැඩසටහන් ග්‍රාමීය හා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම,

(7) කමිටු බල ප්‍රදේශයේ සංස්කෘතික හා කලා නිර්මාණ, ජාතික සහ අන්තර්ජාතික වශයෙන් ව්‍යාප්ත කිරීමේ අවස්ථා ඇති කිරීම සහ කමිටු බල ප්‍රදේශයේ කලාකරුවන්ට විවිධ රටවල දැනුම හුවමාරු කර ගැනීම සඳහා අවස්ථා ඇති කිරීම.

(8) බිම් මට්ටමේ සිටින කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීම සඳහා අතහිත ලබා දීම.

(9) කමිටු බල ප්‍රදේශයේ පදිංචි ව සිටින කලාකරුවන්ගේ සමාජ ආර්ථික මට්ටම ශක්තිමත් කිරීම සඳහා තිරසාර වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.

(10) සදාචාර සම්පන්න ගුණගරුක සමාජයක් බිහි කිරීමට බාධා වන සමාජ වටපිටාවන් ඉවත් කරලීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(11) ප්‍රාදේශීය කලාකරුවන්ගේ මධ්‍යම පළාත තුළ සම්මානයට ප්‍රාත්‍ර කිරීමේදී නිර්දේශයන් ලබා දීම,

(12) ප්‍රාදේශීය කලා උත්සව සංවිධානය කිරීම,

(13) ප්‍රදේශයේ පවතින කලායතන සංවර්ධනය උදෙසා මෙම කමිටුව මගින් විවිධ වැඩසටහන් සංවිධානය කිරීම,

(14) කමිටු බල ප්‍රදේශය තුල කලාකරුවන්ගේ සුභසාධනය සඳහා මැදිහත්වීම,

(15) ප්‍රදේශය තුළ කලා සංස්කෘතික, ඓතිහාසික, ආගමික කටයුතු සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම,

(16) කමිටුව මගින් සංවිධානය කරනු ලබන සංස්කෘතිකමය කාර්යයන් සඳහා අවශ්‍ය කරන සහය රාජ්‍ය, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් නෛතික පුද්ගලයන්ගෙන් ලබාගැනීම,

(17) කමිටු සාමාජිකයන්ගේ ප්‍රසංග, ප්‍රදර්ශන, සංදර්ශන, අලෙවිපොළ, ආදියට වියදම් දැරීම, නැවත ප්‍රතිපූර්ණය කිරීම හා ලබා ගත් ආදයමෙන් කමිටුව තීරණය කර ගත් ප්‍රතිශතයක් අදයම ලෙස ලබා ගැනීම,

(18) කමිටු බල ප්‍රදේශය තුළ සිදුවන ස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීමේ වැඩසටහන් වල සම්බන්ධීකරණය සඳහා මැදිහත්වීම,

(19) කමිටුවේ ගිණුම පවත්වාගෙන යාම සඳහා අරමුදල් රැස්කිරීම.

ප්‍රාදේශීය සංස්කෘතික කමිටුවේ ගිණුම

11. සෑම ප්‍රදේශීය සංස්කෘතික කමිටුවක්ම කමිටු ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානවලට යටත්ව ගිණුමක් පවත්වා ගෙන යා යුතු ය.

පළාත් සංස්කෘතික බල මණ්ඩල පිහිටුවීම

12. පළාත සඳහා මෙහි (මින් මතු බල මණ්ඩලය යනුවෙන් හැඳින්වෙන) පළාත් සංස්කෘතික බල මණ්ඩලය පිහිටුවිය යුතුය.

(1) සෑම ප්‍රාදේශීය සංස්කෘතික කමිටුවකින්ම සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික යන තනතුරු අතරින් තෝරා ගනු ලබන එක් අයෙකුට පළාත් බල මණ්ඩලයේ සාමාජිකත්වය ලබා ගත හැකිය.

(2) පළාත් සංස්කෘතික බල මණ්ඩල සාමාජිකයින් අතරින් මහ සභා රැස්වීමකදී බල මණ්ඩලය සඳහා සභාපතිවරයෙකු, ලේකම්වරයෙකු හා භාණ්ඩාගාරිකවරයෙකු තෝරා පත් කර ගත යුතුය.

(3) පළාත් අධ්‍යක්ෂවරයා, පළාත් බල මණ්ඩලයේ අනුශාසක ධූරය දැරිය යුතු අතර, සංස්කෘතික නිලධාරිවරයෙකු කමිටුවේ සම්බන්ධීකරණය කටයුතු කළ යුතු වන්නේය.

(4) බල මණ්ඩලයේ නිල කාලය වසර එකකි.

පළාත් බල මණ්ඩලයේ බලතල

13. පළාත් බල මණ්ඩලයේ බලතල පහත පරිදි විය යුතුය.

(1) පළාත තුළ පිහිටි අස්පර්ශනීය උරුමයන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය සංස්කෘතික කමිටු මට්ටමින් ගනු ලබන ක්‍රියාදමයන් අධීක්ෂණය කිරීම.

(2) පළාත තුළ පිහිටි ආගමික ස්ථාන සංවර්ධනය කිරීම සඳහා මැදිහත්වීම හා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ක්‍රියාදමයන් අධීක්ෂණය කිරීම

(3) මධ්‍යම පළාතේ ජීවත් වන කලාකරුවන් වෙනුවෙන් මධ්‍යම පළාත් සභාව හෝ මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් වරින් වර ඉදිරිපත් කරනු ලබන සුභසාධන අවස්ථාවන්හී හා වෙනත් විවිධ අවස්ථාවන්හි සමාන හා සමතාවයෙන් බෙදී යන වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීම හා අධීක්ෂණය කිරීම.

(4) පළාත තුළ සිදු කරන විවිධ කලා නිර්මාණයන්ගේ ගුණාත්මකභාවය ඉහල නැංවීම පළාත තුල කලාකරුවන්ගේ තත්ත්වයන් ප්‍රමිතිගත කිරීමට දයක වීම හා එම නිර්මාණ අගය කිරීමේ පසුබමක් ඇති කිරීමට කටයුතු කිරීම

(5) සියළු අංශයන් නියෝජනය කරනු ලබන කලාකරුවන්ගේ අදහස්, යෝජනා සහ සහභාගීත්වය සඳහා වේදිකාවක් ස්ථාපිත කිරීම හා එම කලාකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(6) නව්‍යතාවයෙන් යුතු විවිධ සංස්කෘතික හා කලා වැඩසටහන් ග්‍රාමීය හා මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම

(7) මධ්‍යම පළාතේ සංස්කෘතික හා කලා නිර්මාණ, ජාතකි හා අන්තර්ජාතික වශයෙන් ව්‍යාප්ත කිරීමේ අවස්ථා ඇති කිරීම සහ මධ්‍යම පළාතේ කලාකරුවන්ට විවිධ රටවල දැනුම හුවමාරු කර ගැනීම සඳහා අවස්ථා ඇති කිරීම

(8) බිම් මට්ටමේ සිටින කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීම සඳහා අතහිත ලබා දීම හා කලාකරුවන්ගේ සමාජ ආර්තික මට්ටම ශක්තිමත් කිරීම සඳහා තිරසාර වැඩපිලිවෙලක් සකස් කිරීම.

(9) ග්‍රාමීයව සිදු කෙරෙන විවිධ කලා නිර්මාණයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, ග්‍රාමීය කලාකරුවන්ගේ තත්ත්වයන් ප්‍රමිතිගත කිරීමට දයකවීම හා එම නිර්මාණවලට තරගකාරීත්වයෙන් යුත් නිර්මාණ අගය කිරීමේ පසුබිම්ක් රාජ්‍ය මට්ටමින් ඇති කිරීමට කටයුතු කිරීම.

(10) මධ්‍යම පළාත් බල ප්‍රදේශයේ සංස්කෘතික හා කලා නිර්මාණ, ජාතික සහ අන්තර්ජාතික වශයෙන් ව්‍යාප්ත කිරීමේ අවස්ථා ඇති කිරීම සහ පළාත් බල ප්‍රදේශයේ කළා කරුවන්ට විවිධ රටවල දැනුම හුවමාරු කර ගැනීම සඳහා අවස්ථා ඇති කිරීම.

(11) බිම් මට්ටමේ සිටින කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීම සඳහා අතහිත ලබා දීම.

(12) මධ්‍යම පළාත් කමිට බල ප්‍රදේශයේ පදිංචිව සිටින කලාකරුවන්ගේ සමාජ ආර්ථික මට්ටම ශක්තිමත් කිරීම සඳහා තිරසාර වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.

(13) සදචාර සම්පන්න ගුණගරුක සමාජයක් බිහි කිරීමට බාධා වන සමාජ වටපිටාවන් ඉවත් කරලීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(14) බල මණ්ඩල බල ප්‍රදේශයේ පවතින කලායතන සංවර්ධනය උදෙසා මෙම කමිටුව මගින් විවිධ වැඩසටහන් සංවිධානය කිරීම

(15) බල මණ්ඩල බල ප්‍රදේශය තුල කලාකරුවන්ගේ සුහසාධනය සඳහා මැදිහත්වීම.

(16) බල මණ්ඩල බල ප්‍රදේශට තුල කලා, සංස්කෘතික ඓතිහාසික, ආගමික කටයුතු සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම.

(17) බල මණ්ඩලය මගින් සංවිධානය කරනු ලබන සංස්කෘතිකමය කාර්යයන් සඳහා අවශ්‍ය කෙරෙන සහය රාජ්‍ය, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් නෛතික පුද්ගලයන්ගෙන් ලබා ගැනීම.

(18) බල මණ්ඩල සාමාජිකයන්ගේ ප්‍රසංග, ප්‍රදර්ශන, සංදර්ශන, අලෙවි පොළ, ආදියට වියදම් දැරීම. නැවත ප්‍රතිපූරණය කිරීම හා ලබා ගත් ආදායමෙන් කමිටුව තීරණය කර ගත් ප්‍රතිශතයක් අදයම ලෙස ලබා ගැනීම.

(19) බල මණ්ඩල ප්‍රදේශයේ තුළ සිදුවන ස්පර්ශනීය සංස්කෘතික උරුමයන් සුරක්ෂිත කිරීමේ වැඩසටහන්වල සම්බන්ධීකරණය සඳහා මැදිහත්වීම.

(20) සකලවිධ කලාකරුවන්ගේ සුහසාධනය සලසනු වස් ඇති කරනු ලබන අරමුදල (ගිණුමද) සඳහා විවිධ වැඩසටහන් මගින් අරමුදල් ඒකරාශී කරගැනීම.

14. පළාත් බල මණ්ඩලයට, බල මණ්ඩලයේ සංයුතිය, බල මණ්ඩල ගිණුම හා බල මණ්ඩලය පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් විධිවිධාන ඇතුලත් ව්‍යවස්ථාවක් තිබිය යුතු අතර, බල මණ්ඩල ව්‍යවස්ස්ථාවේ අඩංගු විය යුතු පොදු විධිවිධානයන් පළාත් අධ්‍යක්ෂවරයාගේ නිර්දේශ මත ලේකම් විසින් කලින් කලට නියම කරනු ලැබිය යුතුය. පළාත් බල මණ්ඩල ව්‍යවස්ථාව

(1) බල මන්ඩලයේ අවශ්‍යතාවයන්ට අනුව ඉහත කී පොදු විධිවිධානයන්ට පටහැනි නොවන පරිදි බලමණ්ඩල ව්‍යවස්ථාව සකස් කර ගැනීමට බල මණ්ඩලයට හැකියාව ඇත්තේය.

15. පළාත් බල මණ්ඩලය විසින් බල මණ්ඩල ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධානයන්ට යටත්ව ගිණුමක් පවත්වාගෙන යා යුතුය. බල මණ්ඩල ගිණුම

16. බල මණ්ඩලය හා සෑම ප්‍රාදේශීය කමිටුවක්ම පළාත් අධ්‍යක්ෂ යටතේ ලියාපදිංචි විය යුතුය. බල මණ්ඩලය හා කමිටු ලියාපදිංචිය

17. 16 වන වගන්තියේ සඳහන් ලියාපදිංචිය සඳහා අවශ්‍ය විධිවිධානයන් විෂය භාර අමාත්‍යවරයා විසින් රෙගුලාසි මගින් නියම කළ යුතුය.

## *IV කොටස*

*මධ්‍යම පළාත් සංස්කෘතික ගිණුම පිහිටුවීම.*

මධ්‍යම පළාත් සංස්කෘතික බල මණ්ඩල පිහිටුවීම

18. මධ්‍යම පළාත් සභා අරමුදල යටතේ සංස්කෘතික කටයුතු සඳහා වෙනම ගිණුමක් පවත්වා ගෙන යා යුත්තේය. මෙම ගිණුමේ අරමුදල් කලාකරුවන්ගේ සුබ සාධනය, ජනශ්‍රැති හා ජන කලාවන් සුරක්ෂිත කිරීම , සාදචාර හා ආධ්‍යාත්මික් සංවර්ධනය, පාරම්පරික උරුමයන් සුරක්ෂණය කිරීම යන අරමුණු සඳහා යොද ගත හැකි වන්නේය.

ගිණුමේ ලැබීම්

19. ගිණුමේ ලැබීම් පහත පරිදි වේ.

(1) පළාත් සභාව විසින් වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන
(2) දෙපාර්තමේන්තුවට කරනු ලබන සියලු දේශීය හා විදේශීය ප්‍රදානයන් හා පරිත්‍යාගයන්හි මුදල්,
(3) මෙම ප්‍රඥප්තිය යටතේ පනවන ලද සියලු ගාස්තු

(4) සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් අරමුදල් උත්පාදනය සඳහා සංවිධානය කරනු ලබන වැඩසටහන්වලින් ලැබෙන ආදයම
(5) සංස්කෘතික කණ්ඩායම් වලින් ලැබෙන ආදයම

සංස්කෘතික ගිණුමෙන් මුදල් ගෙවීම්

20. ගිණුමේ මුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා පිළියෙල කරන ඇස්තමේන්තුවක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අත්සන යටතේ පළාත් භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමෙන් පසුව පළාත් භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් කිරීම කළ යුතුය.

ගිණුම විගණනය කිරීම

21. ගිණුමේ ආදයම් හා වියදම් ඇතුළු සියලු ගනුදෙනු වාර්ෂිකව විගණකාධිපතිගේ විගණනයට ලක්විය යුත්තේය. මුදල් වර්ෂය ඉකුත් වී මාස තුනක් ගත වූ පසු විෂය භාර අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ දන ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

මුදල් වර්ෂය ඉකුත් වී මාස 03ක් තුළ විෂය භාර අමාත්‍යවරයා විසින් වාර්ෂික වාර්තාවක් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

## *V කොටස*

පොදු විධිවිධාන

අමාත්‍යවරයා විසින් නියෝග පැනවීම

22. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීමේ කාර්යය සඳහා නියෝග සාදනු ලැබිය හැකිය.

තොරතුරු සැපයීම

(2) (1) වන උප වගන්තිය මගින් පිරිනමනු ලබන බලතල වල පොදු භාවයට අගතියක් නොවන පරිදි අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු හෝ එක් එක් කාරණයක් හෝ සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකිය.

(3) දෙපාර්තමේන්තුවේ කර්තව්‍යය හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත් සංස්කෘතික කණ්ඩායම්, සංස්කෘතික කමිටු හා මධ්‍යම පළාත් බලමණ්ඩල වල කර්තව්‍යයන් හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහාත් අවශ්‍ය වන කාරණා

(4) ප්‍රදර්ශනය හා ප්‍රසිද්ධ රඟදැක්වීම සඳහා සිනමා, චිත්‍රපට අනුමත කිරීම හැර රැගුම් හල් හා රඟදැක්වීම් සංගීතය සිනමාහල් ප්‍රසංග හා විනෝද කටයුතු වල හා ඊට අනුශාංගික කරුණු සම්බන්ධව විධිවිධාන,

(5) පළාතේ සුරක්ෂිත කළයුතු සංස්කෘතික උරුමයන් ලෙස හඳුනාගත් අටපිරිකර හා වෙනත් පූජා භාණ්ඩ ඇඳුම් ආයිත්තම් කළා ශිල්ප ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය හා විකිණීම හා බෙද හැරීම පිළිබඳ ප්‍රමිතීන් නියම කිරීම හා ඊට අනුශාංගික කරුණු පිළිබඳ විධිවිධාන,

(6) පලාතේ සුරක්ෂිත කළයුතු යැයි හඳුනාගත් සංස්කෘතික උරුමයන් සාම්ප්‍රදයික ජනකලාවන්, සාම්ප්‍රදයික නර්තන, ගායනා ප්‍රසිද්ධ ස්ථානවල රඟදැක්වීම් පිළිබඳව හා ඊට අනුශාංගික කරුණු පිළිබඳව විධිවිධාන,

(7) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියලු නියෝග *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු අතර එසේ *ගැසට් පත්‍රය* පළ කිරීමෙන් මාස් 03ක් ඇතුලත පළාත් සභාවට ඉදිරිපත් කර එකී පළාත් සභාව මිගින් අනුමත කරවා ගත යුතුය.

(8) පළාත් සභාව විසින් එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක්ම එය යටතේ කලින් කරනු ලැබූ කිසිවකුට අගතියක් නොවන පරිදි එකී අනනුමතියේ සිට පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතුය.

## *VI කොටස*

### වැරදි හා දණ්ඩන

23. (1) පළාතේ සුරක්ෂිත කළයුතු සංස්කෘතික උරුමයන් ලෙස නම්කරනු ලැබූ අටපිරිකර සහ පූජා භාණ්ඩ, ඇඳුම් ආයිත්තම්, කළා ශිල්ප ආශ්‍රිත භාණ්ඩ නිසි ප්‍රමිතීන්ට අනුකූලව පමණක් නිෂ්පාදනය කිරීම කළ යුතු අතර, ලාභ ලැබීමේ අරමුණින් විකිණීම සහ බෙදහැරීම සිදුකරන්නේ නම් නිසි ප්‍රමිතීන්ට අනුකූලවන සිදු කළ යුතු වන්නේය.

ප්‍රමිතීන්ට අනුකූල නොවන ලෙස භාණ්ඩ නිෂ්පාදනය කිරීම වරදක් බව

(2) පළාතේ සුරක්ෂිත කළයුතු සංස්කෘතික උරුමයන් ලෙස නම්කරනු ලැබූ අටපිරිකර සහ පූජා භාණ්ඩ, ඇඳුම් ආයිත්තම්, කළා ශිල්ප ආශ්‍රිත භාණ්ඩ නිසි ප්‍රමිතීන්ට අනුකූල නොවන ලෙස නිෂ්පාදනය, විකිණීම සහ බෙදහැරීම සිදුකරනු ලබන පුද්ගලයෙක්, ආයතනයක්, පුද්ගලකණ්ඩායමක්, මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලැබේ.

(3) 2 වන උපවගන්තිය යටතේ වරදක් සිදුකරනු ලබන පුද්ගලයෙක්, ආයතනයක්, පුද්ගලකණ්ඩායමක්, මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරුවෙකු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමේදී රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට හෝ වසර දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම එකී තැනැත්තා හෝ තැනැත්තන් යටත් විය යුතුය.

24. 23 (1), 23 (2) උප වගන්තිවල සඳහන් වරදවල් හැර මේ ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියොගයක විධිවිධාන හෝ උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එකී වරද මෙම ප්‍රඥප්තිය මගින් විශේෂයෙන් දණ්ඩනයක් සලසනු නොලැබ ඇති වරදක් වන අවස්ථාවකදී මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරිමේදී රුපියල් දස දහසක් නොඉක්මන දඩයකට හෝ මාස 06ක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

## *VII කොටස*

### අන්තර්කාලීන විධිවිධාන

25. නියමිත දිනට පෙරාතුව සිට මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව සහ එහි පළාත් අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරන පුද්ගලයා මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා 03 වන වගන්තිය යටතේ පත්කළ අධ්‍යක්ෂකවරයා වශයෙන් සලකනු ලැබිය යුතු අතර නියමිත දිනට පෙරාතුව සිට දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් ඉහත 04 වන වගන්තියේ සඳහන් නිලධාරීන් වශයෙන් සලකනු ලැබිය යුතුය.

26. නියමිත දිනට පෙරාතුව සිට ක්‍රියාත්මක වූ සංස්කෘතික දෙපාර්තමේන්තුව සතුව පැවති සියලු වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම්, නඩු කටයුතු සහ එම දෙපාර්තමේන්තුව සමග එළඹී ඇති කොන්ත්‍රාත් සහ ගිවිසුම් සියල්ල මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව යටතේ පවතින වත්කම්, වගකීම්, සියලු ණය බැඳීම් නඩු කටයුතු හා ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතුය.

අර්ථ නිරූපනය

27. මෙම ප්‍රඥප්තියෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

" ස්පර්ශනීය සංස්කෘතික උරුමයන් " යන්නෙන් සියලුම ආගමික ස්ථාන, සංස්කෘතික වටිනාකම් ඇති ස්ථාන, ස්මාරක, පාරම්පරික උරුමයන් පවත්වා ගෙන යා හැකි ලේඛන හා භාණ්ඩ හැඳින්වේ;

" අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් " යනුවෙන් අදහස් වන්නේ සියලුම ආගමික හා සංස්කෘතික උත්සව, ජනශ්‍රැති, පාරම්පරික කලාවන්, අභිචාර විධි හා ශාන්තිකර්මයි;

" ආණ්ඩුකාරවරයා " යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාය;

" අමාත්‍යවරයා " යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික විෂය භාර අමාත්‍යවරයාය;

" පළාත " යන්නෙන් මධ්‍යම පළාත අදහස් වේ;

" පළාත් සභාව " යන්නෙන් මධ්‍යම පළාත් සභාව අදහස් වේ;

" අමාත්‍යංශ ලේකම් " යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික විෂය භාර අමාත්‍යංශයේ ලේකම්ය;

" පළාත් අධ්‍යක්ෂ " යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාතේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාය;

" පළාත් සංස්කෘතික නිලධාරියා " යනුවෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු සංස්කෘතික නිලධාරීවරයාය;

" දේපළ " යන්නෙන් අදහස් වන්නේ සංස්කෘතික අරමුදල සංස්කෘතික කමිටු බලමණ්ඩල සතු පොත්පත්, ලේඛන, බැංකුගත මුදල් හා අතඉතිරි මුදල්, ලීබඩු, උපකරණ, ගොඩනැගිලි හා ඉඩකඩම්, ව්‍යාපෘති හා චංචල නිශ්චල යන සියලුම දේපලය;

" බඳවා ගැනීමේ පරිපාටිය " යන්නෙන් අදහස් වන්නේ මධ්‍යම පළාත් ආණ්ඩුකාර වරයා විසින් අනුමත කරනු ලබන බඳවා ගැනීමේ පටිපාටියයි;

" කළාකරුවා " යන්නෙන් අදහස් වන්නේ නිසර්ඝයෙන්, පාරම්පරිකව හෝ අධ්‍යාපන සුදුසුකම් ලබා, තම බුද්ධිපරිපාකය මෙහෙයවා ගායන, වාදන, නර්තන, සාහිත්‍ය, චිත්‍ර, මූර්ති, කැටයම් ආදී කොට ඇති සකලවිධ කලාවන්හි නිරන්තරව යෙදෙමින් හා යෙදී සිටි හෝ ඒ ඒ අංශ වලින් සමාජයට යම් මෙහෙවරක් ඉටු කළ හො 'ඉටු කරනු ලබන පුද්ගලයකුවේ ;

" සංස්කෘතික කටයුතු " යන්නෙන් අදහස් වන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09 වන උපලේඛනයේ පළවන ලැයිස්තුවේ 25.1 25.2 සහ 29.1, 28 යන විෂයයන් යටතේ සඳහන් කාරණාවන්ය;

අල්ලස් පනතේ උපලේඛනගත ආයතනයක් ලෙස සඳහන් කලයුතු බව

28. දෙපාර්තමේන්තුව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනයේ ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව අර්ථ නිරූපනය කරනු ලැබිය යුතු ය.

සේවකයින් රජයේ නිලධාරියෙකු ලෙස සලකනු ලැබිය යුතු බව

29. දෙපාර්තමේන්තුවේ සියලු නිළධරයන් සහ සේවා නියුක්තිකයන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ කාර්යය සඳහා රජය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

30. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වූවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

08- 648

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.